# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## එකතු කළ අගය මත බදු (සංශෝධන)

**2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා විසින්
2023 සැප්තැම්බර් මස 08 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2023 අගෝස්තු මස 31 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[203 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 24.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

***2 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය''යනුවෙන් සඳහන් කරනු ලබන) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු සංශෝධන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, සරල කරන ලද එකතු කළ අගය මත බදු යෝජනා ක්‍රමය ඉවත් කිරීම වේ.

***3 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එම සංශෝධනය 2 වන වගන්තියට කළ සංශෝධනයට ආනුෂංගික වේ.

***4 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 71 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, එකතු කළ අගය මත බද්ද ආපසු ගෙවීමේ අරමුදලට ගෙවියයුතු බදු අනුපාතය වැඩි කිරීම වේ.

***5 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 83 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එම සංශෝධනය 2 වන වගන්තියට කළ සංශෝධනයට ආනුෂංගික වේ.

***6 වන වගන්තිය:*** ඇතැම් බදු නිදහස් කිරීම් ඉවත් කිරීම සඳහා මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ II වන කොටස සංශෝධනය කරනු ලැබේ.

එල්.ඩී.-ඕ 56/2022

**2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

1. මේ පනත 2023 අංක      දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2002 අංක 14 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම වගන්තියේ (2) වන උපවගන්තියේ (ඉ) ඡේදයේ "භාණ්ඩ හා සේවා සැපයීම මත" යන වචන වෙනුවට ''2024 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව වූ යම් කාලසීමාවක් සඳහා භාණ්ඩ හෝ සේවා සැපයීම මත" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) එම වගන්තියේ, (3) වන උපවගන්තියේ -

(අ) පළමුවන අතුරු විධානයේ (ඊ) ඡේදය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

"(ඊ) කොමසාරිස්-ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වනු ලබන ආකාරයට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති යම් තැනැත්තකු විසින් අපනයනය පිණිස ඇඟළුම් නිෂ්පාදනය කිරීමේ කාර්යය සඳහා ආනයනය කරනු ලබන රෙදිපිළි හෝ උපාංග;";

(ආ) එම උපවගන්තියේ, දෙවන අතුරු විධානයේ (අ) ඡේදයේ -

(i) එහි (vi) වන අයිතමයේ "ආනයනය කරනු ලබන යම් භාණ්ඩ මත;" යන වචන වෙනුවට "2024 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව

ආනයනය කරනු ලබන යම් භාණ්ඩ මත;" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ii) එහි (vii) වන අයිතමයේ "ආනයනය කරනු ලබන යම් පිරියත හෝ යන්ත්‍රසූත්‍ර" යන වචන වෙනුවට "2024 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව ආනයනය කරනු ලබන යම් පිරියත හෝ යන්ත්‍රසූත්‍ර" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (5) වන උපවගන්තියේ දෙවන අතුරු විධානයේ (ඉ) ඡේදයේ "2011 අප්‍රේල් මස 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2011 අප්‍රේල් මස 1 වන දින සිට එහෙත් 2024 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව බලපැවැත්වෙන පරිදි" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (6) වන උපවගන්තියේ පළමු අතුරු විධානය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"එසේ වුවද, (2) වන උපවගන්තියේ විධිවිධානවල සහ,

(අ) මේ (සංශෝධන) පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනට පෙරාතුව වූ කාලසීමාව සඳහා මේ පනතේ පළමුවන උපලේඛනයේ II වන කොටසේ (ඊ) ඡේදයේ (i) වන සහ (ii) වන අයිතමවල; හෝ

(ආ) මේ (සංශෝධන) පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දින හෝ එදිනට පසුව වන යම් කාලසීමාවක් සඳහා මේ පනතේ පළමුවන උපලේඛනයේ III වන කොටසේ (ආ) ඡේදයේ (xxv) වන සහ (xxvi) වන අයිතමවල,

නිශ්චිතව දක්වා ඇති නිදහස්කිරීම්වල කුමක් සඳහන් වුව ද, 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ හඳුනාගෙන ඇති යම් ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක්

සඳහා හෝ අමාත්‍යවරයා විසින් මේ පනතේ පළමුවන උපලේඛනයේ II වන කොටසේ (ඊ) ඡේදයේ (ii) වන අයිතමය යටතේ හෝ මේ පනතේ පළමුවන උපලේඛනයේ (ආ) ඡේදයේ (xxvi) වන අයිතමය යටතේ හඳුනාගෙන ඇති යම් විශේෂ ව්‍යාපෘතියක් සඳහා භාණ්ඩ හෝ සේවා සැපයීමේ යෙදී සිටින යම් ලියාපදිංචි තැනැත්තකු වෙත එවැනි ව්‍යාපෘති සඳහා භාණ්ඩ හෝ සේවා සැපයීම හා සම්බන්ධ භාණ්ඩ හෝ සේවා මිලදී ගැනීම මත යෙදවුම් බද්ද ඉල්ලා සිටීම සඳහා ඉඩදෙනු ලැබිය හැකි ය.";

(3) එම වගන්තියේ (10) වන උපවගන්තියේ -

(අ) දෙවන අතුරු විධානයේ (ii) වන අයිතමය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(ii) 2024 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව වූ යම් කාලසීමාවක් සඳහා යම් සැපයුම්කරුවකු විසින්, 2 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඉ) ඡේදයේ (i) සිට (vii) දක්වා වූ අයිතමයක දක්වා ඇති යම් තැනැත්තකු වෙත කරන ලද සැපයුම් වන්නා වූ මේ පනත යටතේ බදු විලම්භනය කර ඇති යම් සැපයුම්.";

(ආ) එම උපවගන්තියේ තුන්වන අතුරු විධානය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"එසේම තවදුරටත්,-

(අ) මේ (සංශෝධන) පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනට පෙරාතුව වූ කාලසීමාව සඳහා මේ පනතේ පළමුවන උපලේඛනයේ II වන කොටසේ (ඊ) ඡේදයේ (i) සහ (ii) වන අයිතමවල නිශ්චිතව දක්වා ඇති; හෝ

(ආ) මේ (සංශෝධන) පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දින හෝ එදිනට පසුව වන යම් කාලසීමාවක් සඳහා, මේ පනතේ පළමුවන උපලේඛනයේ III වන කොටසේ (ආ) ඡේදයේ (xxv) වන සහ (xxvi) වන අයිතමවල නිශ්චිතව දක්වා ඇති,

2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ හඳුනාගෙන ඇති යම් ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා හෝ අමාත්‍යවරයා විසින් මේ පනතේ පළමුවන උපලේඛනයේ II වන කොටසේ (ඊ) ඡේදයේ (ii) වන අයිතමය යටතේ හෝ මේ පනතේ පළමුවන උපලේඛනයේ (ආ) ඡේදයේ (xxvi) වන අයිතමය යටතේ හඳුනාගෙන ඇති යම් විශේෂ ව්‍යාපෘතියක් සඳහා භාණ්ඩ හෝ සේවා සැපයීම සිදුකරන යම් තැනැත්තකුට මේ උපවගන්තිය යටතේ ඉඩදිය හැකි නිමැවුම් බදු නිසැකව දැන ගැනීමේ කාර්යය සඳහා, එම ව්‍යාපෘතියේ අදාළ කාලසීමාව සඳහා සැපයුකරුවකු විසින් සිදුකරන ලද සැපයුම්වල වටිනාකම, නිමැවුම් බද්ද ගණනය කරනු ලබන බදු අය කළ හැකි සැපයුමක් ලෙස සලකනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 71 වන වගන්තිය සංශෝධනය කිරීම

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 71 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ii) වන ඡේදයේ (ආ) අනුඡේදය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(ආ) 2014 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසු එහෙත් 2024 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව වන යම් කාලසීමාවක් සඳහා සියයට හයක්;

(ඇ) 2024 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව වන යම් කාලසීමාවක් සඳහා සියයට දහයක්.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 83 වන වගන්තිය සංශෝධනය කිරීම

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 83 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) "නිෂ්පාදනය" යන යෙදුමට ඉක්බිතිව ම පහත දැක්වෙන යෙදුම ඇතුළත් කිරීමෙන්:-

""අමාත්‍යවරයා" යන්නෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 හෝ 45 වන ව්‍යවස්ථාව ප්‍රකාර මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයා අදහස් වේ;";

(2) "බදු අය කළ හැකි කාලසීමාව" යන යෙදුමේ-

(අ) (2) වන ඡේදයේ "2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් කාලසීමාවක් සඳහා" යන වචන සහ ඉලක්කම් වෙනුවට-

"2011 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසු එහෙත් 2024 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් කාලසීමාවක් සඳහා" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ආ) එම යෙදුමේ (2) වන ඡේදයේ (ආ) අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:-

"(3) 2024 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව වන යම් කාලසීමාවක් සඳහා-

(අ) (i) යම් තැනැත්තකු විසින් ශූන්‍ය අනුප්‍රමාණගත සැපයුම් සිදු කරන අවස්ථාවක දී;

(ii) යම් තැනැත්තකු විසින් ව්‍යාපාරයක් හෝ ව්‍යාපෘතියක් ආරම්භ කොට මේ පනතේ 22 වන වගන්තියේ (7) වන උපවගන්තියේ නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම සඳහා එකඟ වී ඇති අවස්ථාවක දී,

මාස එකක කාලසීමාවක් අදහස් වේ;

(ආ) (අ) ඡේදයේ දක්වා ඇති තැනැත්තකු නොවන හෝ කොමසාරිස්-ජනරාල්වරයාගේ අනුමතය මත කාර්තුමය වාර්තා ඉදිරිපත් කිරීමට එකඟ වන්නා වූ ද තැනැත්තකු වන ලියාපදිංචි තැනැත්තකු සම්බන්ධයෙන් එක් එක් වර්ෂයේ පිළිවෙළින් ජනවාරි මස පළමුවන දිනයෙන්, අප්‍රේල් මස පළමු වන දිනයෙන්, ජූලි මස පළමුවන දිනයෙන් සහ ඔක්තෝබර් මස පළමුවන දිනයෙන් ආරම්භ වන මාස තුනක කාලසීමාවක් අදහස් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ II වන කොටස පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම කොටසේ ශීර්ෂයේ "(උපලේඛනයට පසුව එළඹෙන සංශෝධනවල නිශ්චිතව දක්වා ඇති බලාත්මක වීමේ දිනවලට යටත්ව) 2004 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසු ආරම්භ වන බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා-;" යන වචන සහ ඉලක්කම් වෙනුවට "(උපලේඛනයට පසුව එළඹෙන සංශෝධනවල නිශ්චිතව දක්වනු ලබන බලාත්මක වීමේ දිනවලට යටත්ව) 2004 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භ වන එහෙත් පනත් කෙටුම්පත පාර්ලිමේන්තු පනතක් බවට පත් වන මාසයේ අවසාන දින හෝ එදිනට පෙර අවසන් වන යම් බදු අයකළ හැකි කාලසීමාවක් සඳහා-" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;"; සහ

(2) එම කොටසේ (ක) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් කොටස ඇතුළත් කිරීමෙන්:-

"III වන කොටස

පනත් කෙටුම්පත පාර්ලිමේන්තු පනතක් බවට පත්වන මාසයට ඉක්බිතිව ම එළඹෙන මාසයේ පළමුවන දින හෝ එදිනට පසු ආරම්භ වන යම් බදු අයකළ හැකි කාලසීමාවක් සඳහා-

| | | |
|---|---|---|
| (අ) | (i) | තිරිඟු සහ තිරිඟු පිටි; |
| | (ii) | ළදරු කිරි පිටි; |
| | (iii) | අවසන් භාවිතය ප්‍රතිකාරක හෝ රෝග නිවාරණ බලපෑමක් ඇති බවට සීමා කර ඇති සහ වෛද්‍යවරයකුගේ නිර්දේශය මත මිල දී ගනු ලබන (සුවඳ විලවුන් නොවන) ඖෂධ නිෂ්පාදන, ඖෂධ වර්ග සහ එවැනි නිෂ්පාදන හෝ ඖෂධ නිෂ්පාදනය කිරීම හෝ නිපදවීම සඳහා භාවිත කරනු ලබන අමුද්‍රව්‍ය; |
| | (iv) | යම් රෝගයකින් පෙළෙන තැනැත්තන් සඳහා වෛද්‍ය ප්‍රතිකාර ලබාදීම පිණිස අවස්ථාවෝචිත පරිදි, 1961 අංක 31 දරන ආයුර්වේද පනත යටතේ හෝ 2016 අංක 10 දරන හෝමියෝපති පනත යටතේ ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරයකුගේ හෝ හෝමියෝපති වෛද්‍යවරයකුගේ බෙහෙත් වට්ටෝරුවක් මත මිල දී ගනු ලබන සහ එහි අවසන් භාවිතය ප්‍රතිකාරක හෝ රෝග නිවාරණ බලපෑමක් සහිත බවට සීමාකර ඇති (සුවඳ විලවුන් සංයෝග නොවන) ආයුර්වේද හෝ හෝමියෝපති නියෝග, ආයුර්වේද ඖෂධ නිසන්ඩුවට අයත් ආයුර්වේද හෝ හෝමියෝපති සංයෝග හෝ රේගු කාර්ය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද |

| | | |
|---|---|---|
| | | සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක යටතේ හඳුනාගත් සහ 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 3 වන වගන්තිය යටතේ පත් කරන ලද ආයුර්වේද කොමසාරිස්වරයාගේ නිර්දේශය සහිත යුනානි හෝ සිද්ධ සංයෝග සහ එම සංයෝග සඳහා භාවිත කරනු ලබන අමුද්‍රව්‍ය; |
| | (v) | පිරිපහදු නොකරන ලද ඛනිජතෙල්, භූමිතෙල් ද්‍රවීකෘත ඛනිජතෙල් ගෑස්, ගුවන්යානා ඉන්ධන, පෙට්‍රල්, ඩීසල්, නැව් සඳහා භාවිත කරන තෙල් හෝ රේගු කාර්ය සඳහා සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 2710.19.60 යටතේ හඳුනාගත් දැවිතෙල්; |
| | (vi) | කෘත්‍රිම අත්පා, කිහිලිකරු, රෝද පුටු, ශ්‍රවණ ආධාරක, එවැනි ආධාරක සඳහා වන උපාංග හෝ විකලතාවක් හෝ අශක්නුතාවක් සඳහා උපකාර පිණිස පළඳින හෝ රැගෙන යන හෝ මිනිස් සිරුරේ තැන්පත් කරන විශේෂිත උපකරණ, අන්ධ තැනැත්තන් සඳහා වූ සුදු සැරයටි, බ්‍රේල් යතුරු ලියන යන්ත්‍ර සහ කොටස්, බ්‍රේල් ලිවීමේ කඩදාසි, බ්‍රේල් යතුරු ලියන පුවරු සහ තත්කාර්ය සඳහා ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් මත එවැනි තැනැත්තන් විසින් ඉල්ලා සිටින සහනයේ තත්ත්වය පිළිබඳ සැලකිල්ලට ගෙන අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන පරිදි වෙනත් යම් අයිතම; |
| | (vii) | රේගු කාර්ය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක යටතේ හඳුනාගත් කෘෂිකාර්මික ට්‍රැක්ටර් සහ මාර්ග ට්‍රැක්ටර් සඳහා අර්ධ ට්‍රේලර්; |
| | (viii) | රේගු කාර්ය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක යටතේ හඳුනාගත් කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ, උදලු, මුල්ලු, පොහොර, ආටිමියා බිත්තර සහ පීට් පාසි; |
| | (ix) | කෘෂිකාර්මික බීජ, කෘෂිකාර්මික පැළ, ඉස්සන් සඳහා ආහාර ඇතුළුව කුකුළ කුනිස්සන් සඳහා ආහාර සහ කුකුළු ආහාර හැර සත්ව ආහාර; |
| | (x) | රේගු කාර්ය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක යටතේ හඳුනාගත් රෙදිපිළි කර්මාන්තය සඳහා භාවිත කරනු ලබන නූල්; |
| | (xi) | රේගු කාර්ය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක යටතේ හඳුනාගත් අත්යන්ත්‍ර කර්මාන්තය සඳහා භාවිත කරනු ලබන වර්නක (ඩයි වර්ග); |
| | (xii) | රේගු කාර්ය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක යටතේ හඳුනාගත් සූර්ය බලශක්ති උත්පාදනය කිරීම සඳහා වූ සූර්ය බලශක්ති පනේල ආකෘති, උපාංග හෝ ගෘහස්ථ සූර්ය බලශක්ති පද්ධති; |

| | | | |
|---|---|---|---|
| | (xiii) | රේගු කාර්ය සඳහා සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක යටතේ හඳුනාගත්1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ ආනයනය කිරීමේ දී නිෂ්පාදන බද්දට යටත්වන යම් මෝටර් වාහනයක් හෝ නිෂ්පාදනය කිරීමේදී එම බද්දටම යටත්වන යම් මෝටර් වාහනයක්, | |
| සැපයීම හෝ ආනයනය කිරීම; | | | |
| (ආ) | (i) | යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් සපයනු ලබන අධ්‍යාපනික සේවා; | |
| | (ii) | (ගුවන් ප්‍රවාහනය, ජලය මගින් ප්‍රවාහනය හෝ සංචාරකයින් ප්‍රවාහනය කිරීම, විනෝද චාරිකා සහ කුලී රථ සේවා හැර) පොදු මගී ප්‍රවාහන සේවා; | |
| | (iii) | බෙදාහැරීම ද ඇතුළුව විදුලිබලය; | |
| | (iv) | යම් ආයතනයක් හෝ තැනැත්තකු විසින් සපයනු ලබන භූමදාන සහ ආදාහන කටයුතු සම්බන්ධ සේවා; | |
| | (v) | බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ ආගමන කවුළුවට ඔබ්බෙන් පිහිටා ඇති භෝජනාගාරයක සපයනු ලබන සේවා; | |
| | (vi) | 1996 අංක 9 දරන තානාපති වරප්‍රසාද පනතේ විධිවිධාන අදාළ වන යම් රාජ්‍යයක දූත මණ්ඩලයකට හෝ යම් සංවිධානයකට සපයනු ලබන භාණ්ඩ සහ සේවා හෝ එවැනි වරප්‍රසාද සඳහා හිමිකම් ලබන එවැනි දූත මණ්ඩලයක හෝ සංවිධානයක කාර්ය මණ්ඩලය සඳහා ලබා දෙන භාණ්ඩ හා සේවා:-<br><br>එසේ වුව ද, ශ්‍රී ලංකාවේ ඊට අනුරූපී ප්‍රතිපාර්ශ්ව කාර්ය මණ්ඩලයට, කොමසාරිස්-ජනරාල්වරයා විසින් එසේ පවතින බවට හඳුනාගනු ලබන අන්‍යෝන්‍ය ප්‍රතිලාභ හිමිකම් පවතී; | |
| | (vii) | ස්වභාවික හෝ මානව ව්‍යසන හෝ වෙනත් යම් ක්‍රියාකාරකමක් හේතුවෙන් සිදුවන හදිසි ආපදා සඳහා සහන සැලසීම පිණිස හෝ ජාතික ආර්ථිකයේ යහපත පිළිබඳ සැලකිල්ලට ගෙන අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන යම් ක්‍රියාකාරකමක් සඳහා විදේශීය සංවිධාන විසින් සෘජුවම අරමුදල් සපයනු ලබන භාණ්ඩ හෝ සේවා; | |
| | (viii) | පහත දැක්වෙන මූල්‍ය සේවා:- | |
| | | (අ) | යම් ජංගම, තැන්පතු හෝ ඉතිරිකිරීමේ ගිණුමක් පවත්වාගෙන යාම; |

| | | | | |
|---|---|---|---|---|
| | | (ආ) | ව්‍යවහාර මුදල් හුවමාරු කිරීම; | |
| | | (ඇ) | යම් නෝට්ටුවක්, ගෙවීම් නියෝගයක්, චෙක්පතක් හෝ ණයවර ලිපියක් නිකුත් කිරීම, ඒ සඳහා මුදල් ගෙවීම, රැස්කිරීම හෝ ඒවායේ අයිතිය පැවරීම; | |
| | | (ඈ) | යම් තැනැත්තකු විසින් ණය වී ඇති මුදල ගෙවීමට ඇති යම් අයිතිවාසිකමක් හෝ හිමිකමක් ඇත්තා වූ යම් ණය සුරැකුම්පතක් නිකුත් කිරීම, වෙන් කිරීම, අයිතිය පැවරීම, අණ කිරීම, ප්‍රතිග්‍රහණය හෝ පිටසන් කිරීම; | |
| | | (ඉ) | යම් සම කොටස් සුරැකුම්පතක්, ණය සුරැකුම්පතක් හෝ සහභාගී සුරැකුම්පතක් නිකුත් කිරීම, වෙන් කිරීම, හෝ අයිතිය පැවරීම; | |
| | | (ඊ) | යම් සම කොටස් සුරැකුම්පතක්, ණය සුරැකුම්පතක් හෝ සහභාගී සුරැකුම්පතක් නිකුත් කිරීම පැවරීම හෝ අතුරු පැවරීම; | |
| | | (උ) | යම් ණය මුදලක්, අත්තිකාරකාරම් මුදලක් හෝ බැරපතක්; | |
| | | (ඌ) | (i) | වෙනම ගාස්තුවක් අයකරනු ලබන සහ සැපයීම සිදු කරන තැනැත්තා වෙත හෙළිදරව් කරනු ලබන කුලී සින්නක්කර කොන්දේසිමය විකිණීමක් හෝ බැරකම් විකිණීමේ ගිවිසුමක දී සපයනු ලබන වාරික බැරකම් මූල්‍ය පහසුකම්; |
| | | | (ii) | එම ගිවිසුමේ දිනය වන විට මාස දොළහකට නොඅඩු කාලයක් සඳහා ශ්‍රී ලංකාවේ දී භාවිත කර ඇති කුලී සින්නක්කර ගිවිසුමක් හෝ කොන්දේසිමය විකුණුමක් යටතේ සපයනු ලබන භාණ්ඩ; |
| | | | (iii) | මූල්‍ය කල්බදු ගිවිසුමක් යටතේ සපයනු ලබන කල්බදු පහසුකම්; |
| | | (එ) | ජීවිත රක්ෂණය, "අග්‍රහාර" රක්ෂණය සහ භෝග සහ පශු සම්පත් රක්ෂණය; | |
| | | (ඒ) | බලපත්‍රලාභී වාණිජ බැංකුවක අක්‍රීය ණය මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරනු ලබන පරිදි බැංකුව ප්‍රතිව්‍යුහගත කිරීමේ යෝජනා ක්‍රමයක් හෝ එම බැංකුවේ වෙනත් යම් යෝජනා ක්‍රමයක් ප්‍රකාරව වෙනත් යම් තැනැත්තකු වෙත පැවරීම; | |

| | | |
|---|---|---|
| | (ix) | රෝහල් කාමර ගාස්තු හැර, සෞඛ්‍යාරක්ෂක සේවා සපයන වෛද්‍ය ආයතන විසින් හෝ වෘත්තීමය වශයෙන් සුදුසුකම්ලත් තැනැත්තන් විසින් සපයනු ලබන සියලු සෞඛ්‍යාරක්ෂක සේවා; |
| | (x) | විකිණීම සඳහා කරනු ලබන සකස් කිරීමක් හැර කිසිදු පිරිසැකසුම් කිරීමකින් තොරව එම අයිතම අලෙවි කරනු ලබන බවට වූ කොන්දේසියට යටත්ව 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත යටතේ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දට යටත්ව ආනයනය කරන ලද යම් අයිතම; |
| | (xi) | 1978 අංක 1 දරන ටවර්හෝල් රඟහල පදනම පනත මගින් පිහිටුවන ලද ටවර්හෝල් රඟහල පදනම විසින් හෝ 1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල පදනම පනත යටතේ පිහිටුවන ලද මධ්‍යම සංස්කෘතික අරමුදල මගින් සපයනු ලබන සේවා; |
| | (xii) | මුහුදු වැලි; |
| | (xiii) | දේශීය වශයෙන් නිෂ්පාදිත අත්යන්ත්‍ර රෙදිපිළි; |
| | (xiv) | එම නිෂ්පාදන දේශීය වශයෙන් නිපදවන තාක් දුරට සහල්, සහල් පිටි සහ පාන්; |
| | (xv) | ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත පිරිසැකසුම් නොකළ කෘෂිකාර්මික, උද්‍යාන විද්‍යාත්මක හෝ මත්ස්‍ය නිෂ්පාදන; |
| | (xvi) | 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් තේ කර්මාන්ත යන්ත්‍රෝපකරණයක් වශයෙන් හඳුනාගෙන ඇති තේ කර්මාන්තය සඳහා භාවිත කරනු ලබන දේශීය වශයෙන් නිෂ්පාදිත යන්ත්‍රෝපකරණ; |
| | (xvii) | ශල්‍යකර්ම සඳහා භාවිත කරනු ලබන දේශීය වශයෙන් නිෂ්පාදිත ශල්‍යකර්ම දැල් රෙදි (ගෝස්); |
| | (xviii) | 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නිකුත් කරනු ලබන ගැසට් නිවේදනයක නිශ්චිතව දක්වනු ලබන ආකාරයට රේගු අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, රට තුළට ඇතුළුවන ස්ථානයේ දී, ආනයනය කිරීම මත වෙනත් යම් බද්දක් අය කරනු ලැබීම වෙනුවට රේගු කාර්ය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක යටතේ වර්ගීකරණය කරන ලද විශේෂිත අනුපාතිකයක් යටතේ වූ සෙස් බද්දකට යටත්වන රෙදිපිළි; |
| | (xix) | මේ පනත යටතේ බදු අය කිරීමේ කාර්යය සඳහා, වාණිජ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය හෝ ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් යම් අපනයන කටයුතු හෝ සේවා සපයන්නකු වෙත සපයනු ලබන ශුන්‍ය අනුප්‍රමාණගත සේවා වන තාක් දුරට වන යම් සේවා; |

| | | |
|---|---|---|
| | (xx) | ශ්‍රී ලංකාවේ සිටින තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත සිටින වෙනත් යම් තැනැත්තකු වෙත ඔහු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත පරිභෝජනය කිරීම හෝ භාවිත කිරීම පිණිස සපයනු ලබන සහ ගෙවීම් කටයුතු ශ්‍රී ලංකා රුපියල්වලින් සිදු කරනු ලබන සේවා; |
| | (xxi) | අපනයන සංවර්ධන ප්‍රතිදාන වශයෙන් අපනයන සංවර්ධන අරමුදලින් ගෙවනු ලබන යම් මුදලක්; |
| | (xxii) | නූල්, රෙදිපිළි හෝ ඇඟළුම් නිෂ්පාදන අපනයනය කරන්නන් හැර වෙනත් යම් තැනැත්තන් වෙත සපයනු ලබන සේවාවන් වන තාක් දුරට නූල්, රෙදිපිළි, හෝ ඇඟලුම්වල තත්ත්වය, ගති ලක්ෂණ හෝ වටිනාකම ප්‍රවර්ධනයවීමක් සිදුවන සේවාවන්; |
| | (xxiii) | වෘද්ධ සේවාවන්  සහ ළමා සත්කාරක සේවාවන්; |
| | (xxiv) | "බාහිර පිවිසුම් ක්‍රියාකරුවන්" විසින් දේශීය විදුලි සංදේශ ක්‍රියාකරුවන් වෙත සපයනු ලබන ජාත්‍යන්තර විදුලි සංදේශ සේවාවන්; |
| | (xxv) | 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3(4) වන වගන්තිය ප්‍රකාරව ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් වශයෙන් හඳුනාගෙන ඇති යම් ව්‍යාපෘතියක් සඳහා සපයනු ලබන භාණ්ඩ හෝ සේවා; |
| | (xxvi) | (අ) බදු ගෙවීම රජය විසින් දරනු ලබන සහ රටෙහි ආර්ථිකමය සුබසිද්ධිය පිළිබඳ සලකා බැලීමෙන් පසුව අමාත්‍යවරයා විසින් හඳුනාගනු ලබන යම් විශේෂිත ව්‍යාපෘතියක් සඳහා සපයනු ලබන භාණ්ඩ හෝ සේවා; හෝ<br><br>(ආ) අදාළ රජයේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය මත අමාත්‍යවරයා විසින් අනුමත කර ඇති යම් යටිතල සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා රජයේ අමාත්‍යාංශ වෙත විදේශ ණය හෝ පරිත්‍යාග වශයෙන් අරමුදල් ලැබෙන යම් යටිතල සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා සපයනු ලබන භාණ්ඩ සහ සේවා; |
| | (xxvii) | (422 වන අධිකාරය වූ මුදල් නීති පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සපයනු ලබන භාණ්ඩ හෝ සේවා; |
| | (xxviii) | ඒකාබද්ධ අරමුදලින් හෝ රජය හරහා සංවිධානය කරනු ලබන යම් ණය මුදලකින් ලබා දිය යුතු බවට පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලබන ගාස්තු ගෙවීමෙන් නිදහස් සහ එම සේවා ශ්‍රී ලංකා රජය වෙනුවෙන් සපයනු ලබන තාක් දුරට යම් රාජ්‍ය සංස්ථාවක් විසින් සපයනු ලබන සේවා; |
| | (xxix) | විදේශ ව්‍යාවහාර මුදලින් ගෙවීම් කිරීම පිණිස තීරු බදු රහිත නිදහස් සාප්පු සඳහා දේශීයව නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ; |

| | | |
|---|---|---|
| | (xxx) | ආනයනය කරනු ලැබූයේ යම්, ආනයනය මත බදු ගෙවීමෙන් නිදහස් කරනු ලැබිය හැකි වූ (දේශීය වශයෙන් සපයනු ලබන) යම් භාණ්ඩ, |
| සැපයීම. | | |
| (ඇ) | (i) | (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනතේ 107 වන වගන්තිය යටතේ සාදන ලද මගී ගමන් බඩු (නිදහස් කිරීමේ) නියෝග යටතේ බදු රහිතව නිෂ්කාශනය කර ගැනීමට හිමිකම ඇති යම් අයිතමයක් හෝ එකී ආඥාපනතේ "අ" උපලේඛනයේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට ප්‍රති-අපනයනය කිරීමේ සහතිකය මත බදු රහිතව නිෂ්කාශනය කර ඇති යම් අයිතමයක් හෝ නැව් ගබඩා කිරීම් වශයෙන් භාවිත කිරීම සඳහා බැඳුම්කරයක් රහිතව නිෂ්කාශනය කරන අයිතම; |
| | (ii) | 2 වන වගන්තියේ (3) වන උපවගන්තියේ දෙවන අතුරු විධානයේ (ආ) ඡේදය ප්‍රකාරව බදු විලම්භනය කර ඇත්තා වූ ද,-<br><br>(අ) ප්‍රදර්ශන භාණ්ඩ ලෙස නිරූපණය සඳහා භාවිත කරනු ලබන සහ අවස්ථාවෝචිත පරිදි, එම නිරූපණය, ප්‍රදර්ශනය හෝ අවසන් වීමෙන් පසුව ප්‍රති-අපනයනය කරනු ලබන භාණ්ඩ; හෝ<br><br>(ආ) යම් ව්‍යාපෘතියක් සඳහා භාවිත කිරීම සඳහා ආනයනය කරන ලද සහ එම ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමෙන් පසු ප්‍රති-අපනයනය කරනු ලබන පිරියත, යන්ත්‍රසූත්‍ර සහ උපකරණ;: |
| | (iiii) | රේගු කාර්යය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක යටතේ හඳුනාගෙන ඇති ගුවන්යානා එන්ජින් හෝ ගුවන්යානා අමතර කොටස්; |
| | (iv) | විදුලිබලය උත්පාදනය කිරීම පිණිස ලංකා විදුලිබල මණ්ඩලය වෙත සපයනු ලැබීම සඳහා ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව විසින් සපයනු ලබන රසායනික නැප්තා; |
| | (v) | (අ) රජය විසින් බදු ගෙවීම දරනු ලබන සහ රටෙහි ආර්ථික ප්‍රතිලාභය පිළිබඳ සැලකිල්ලට ගෙන අමාත්‍යවරයා විසින් හඳුනාගනු ලබන යම් විශේෂිත ව්‍යාපෘතියක් සඳහා සපයනු ලබන භාණ්ඩ; හෝ<br><br>(ආ) 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ විධිවිධාන යටතේ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් වශයෙන් හඳුනාගෙන ඇති යම් ව්‍යාපෘතියක් සඳහා එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාලසීමාව තුළ දී එහි නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව සපයනු ලබන භාණ්ඩ; හෝ |

| | | |
|---|---|---|
| | | (ඇ) අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය මත අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන පරිදි ශ්‍රී ලංකා රජයේ යම් අමාත්‍යාංශයක් වෙත විදේශීය ණය හෝ පරිත්‍යාග වශයෙන් සෘජුව ම අරමුදල් සපයන යම් යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතියක් වෙත සපයනු ලබන භාණ්ඩ; |
| | (vi) | 1996 අංක 9 දරන තානාපති වරප්‍රසාද පනතේ විධිවිධාන අදාළ වන යම් රාජ්‍යයක දූත මණ්ඩලයකට හෝ යම් සංවිධානයකට සපයනු ලබන භාණ්ඩ සහ සේවා හෝ එවැනි වරප්‍රසාද සඳහා හිමිකම් ලබන එවැනි දූත මෙහෙවරක හෝ සංවිධානයක කාර්ය මණ්ඩලය සඳහා ලබා දෙන භාණ්ඩ හා සේවා:<br><br>එසේ වුව ද, ශ්‍රී ලංකාවේ ඊට අනුරූපී ප්‍රතිපාර්ශ්ව කාර්ය මණ්ඩලයට, කොමසාරිස්-ජනරාල්වරයා විසින් එසේ පවතින බවට හඳුනාගනු ලබන අන්‍යෝන්‍ය ප්‍රතිලාභ හිමිකම් පවතී; |
| | (vii) | ස්වභාවික හෝ මානව ව්‍යසන හෝ වෙනත් ක්‍රියාකාරකමක් හේතුවෙන් සිදුවන හදිසි ආපදා සඳහා සහන සැලසීම පිණිස හෝ අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන යම් ක්‍රියාකාරකමක් සඳහා විදේශ සංවිධානය විසින් සෘජුවම අරමුදල් සපයනු ලබන භාණ්ඩ හා සේවා, |
| ආනයනය කිරීම. | | |
| (ඈ) | විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීම් කිරීම සඳහා තීරු බදු රහිත සාප්පුවලට සැපයීම සඳහා භාණ්ඩ ආනයනය කිරීම සහ සැපයීම.”. | |

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**7.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.